අන්තර්ජාල අනුවාදයකි.

# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1999 අංක 3 දරන විශේෂ අධ්‍යාපන සේවා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1999 පෙබරවාරි මස 10 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1999 පෙබරවාරි මස 12 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
ගැසට් පත්‍රයේ **II** වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. **5.75** යි. තැපැල් ගාස්තුව : රු. **3.50** යි.

## 1999 අංක 3 දරන විශේෂ අධ්‍යාපන සේවා සමිතිය (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1999 පෙබරවාරි මස 10 වන දින.]

එල්. ඩී.–ඕ. 18/95

### විශේෂ අධ්‍යාපන සේවා සමිතිය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.

"විශේෂ අධ්‍යාපන සේවා සමිතිය" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන සංගමයක් එහි සාමාජිකයන් එකඟ වූ රීති අනුව, එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමේ සහ කරගෙන යාමේ කාර්යය සඳහා මෙතෙක් කල් තංගල්ලේ පොළොම්මාරුවේ පිහිටුවා තිබූ හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ සහ කරුණු මෙතෙක් කල් එකී සංගමය විසින් සාර්ථකව ක්‍රියාත්මක කර හා කරගෙන ගොස් ඇති හෙයින් සහ එම සංගමය සංස්ථාගත කරනු ලැබීමට දැන් ඉල්ලුම් කර ඇති හෙයින් ද එකී ඉල්ලීම ඉටු කිරීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :–

**1**. මේ පනත 1999 අංක 3 දරන විශේෂ අධ්‍යාපන සේවා සමිතිය. (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

**2**. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දින සිට සහ ඉන් පසුව (මෙහි මින් මතු "සමිතිය" යනුවෙන් සඳහන් කරනු ලබන) තංගල්ලේ පොළොම්මාරුවේ විශේෂ අධ්‍යාපන සේවා සමිතියේ දැනට සාමාජිකයන්ව සිටින තාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් "විශේෂ අධ්‍යාපන සේවා සමිතිය" යන නාමය සහ අභිධානය යටතේ අවිච්ඡින්න පැවැත්මක් ඇති සංස්ථාවක් විය යුතු අතර පොදු මුද්‍රාවක් තබා ගෙන එය පාවිච්චි කිරීමේ ද, ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමේ ද පූර්ණ බලය හා අධිකාරය ඇතිව සංස්ථාව විසින් එකී නාමයෙන් සියලු අධිකරණවල නඩු පැවරීම හා එයට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කළ හැකි ද කළ යුතු ද වන්නේය. විශේෂ අධ්‍යාපන සේවා සමිතිය සංස්ථාගත කිරීම.

සංස්ථාවේ පොදු පරමාර්ථ.

**3**. සංස්ථාව පිහිටුවීමට අරමුණු කොටගත් පොදු පරමාර්ථ පහත දැක්වෙන පරිදි විය යුතු යයි මෙයින් ප්‍රකාශ කරනු ලැබේ. :–

(අ) ආබාධිත තැනැත්තන්ට අධ්‍යාපන සේවාවන් සැපයීමෙන් ආබාධිත තැනැත්තන් පුනරුත්ථාපනය කිරීම හා ඔවුන් සමාජ සේවාවේ නියුක්ත කිරීම ;

(ආ) ආබාධිත තැනැත්තන්ට අවශ්‍ය ප්‍රදානයන් කිරීම ;

(ඇ) ස්වාභාවික විපත්වලට භාජනය වන්නන්ට අවශ්‍ය ආධාර සැපයීම ;

(ඈ) ආබාධිත තැනැත්තන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා සුරක්ෂිත කිරීම ;

(ඉ) ආබාධිත තැනැත්තන්ට පෝෂ්‍යදායී ආහාර පාන, වෛද්‍ය පහසුකම් වෘත්තීය පුහුණුව සහ රැකියා ලබාදීම සඳහා කටයුතු කිරීම ;

(ඊ) පුස්තකාල පිහිටුවා පවත්වාගෙන යාම, පොත්පත්, සඟරා, සමරු කලාප සහ වාර සඟරා ආදියට දායකවීම සහ ඒවා නිකුත් කිරීම ;

(උ) ප්‍රදර්ශන, දේශන, සම්මන්ත්‍රණ, දාර්ශනික සාකච්ඡා, වැඩමුළු පන්ති, විවාද, සම්මේලන, චාරිකා, විනෝද ගමන් ප්‍රවර්ධනය කිරීම, පිළියෙල කිරීම, සංවිධානය කිරීම හා පැවැත්වීම ;

(ඌ) සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇති වෙනත් සමිති, සංගම් හෝ සංවිධාන සමග සහයෝගීවීම සහ සහාවර්ය වීම ;

(එ) ඉහත සඳහන් පරමාර්ථ මුදුන්පත් කර ගැනීම සඳහා හිතකර ආනුෂංගික වන හෝ විය හැකි වෙනත් ක්‍රියා සහ දේ කිරීම.

සංස්ථාවේ සාමාන්‍ය බලතල.

**4**. බැංකු ගිණුම් විවෘත කිරීමේ, පවත්වා ගෙන යාමේ සහ වැසීමේ ද ඇප ඇතිව හෝ නැතිව මුදල් ණයට ගැනීමේ හෝ ලබා ගැනීමේ ද ප්‍රදාන හා පරිත්‍යාග ලබා ගැනීමේ ද ස්වකීය අරමුදල් ආයෝජනය කිරීමේ ද සංස්ථාවේ පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නිලධරයන් සහ සේවකයන් සේවයට බඳවා ගැනීමේ, සේවයේ නියුක්ත

කිරීමේ සහ සේවයෙන් පහකිරීමේ ද බලය ඇතුළුව, සංස්ථාවේ පරමාර්ථ හෝ ඒ පරමාර්ථ අතුරින් යම් කිසිවක් හෝ ප්‍රවර්ධනය කිරීම හෝ නංවාලීම සඳහා අවශ්‍ය වන හෝ යෝග්‍ය වන කවර වූ හෝ සියලු ක්‍රියා, කාරණා සහ දේ ඉටු කිරීමේ සහ ක්‍රියාත්මක කිරීමේ බලය මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව, සංස්ථාවට ඇත්තේය.

සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම.

**5**. (1) සංස්ථාවේ කටයුතු, සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීති මගින් විධිවිධාන සලස්වා ඇති පරිදි හා ඒවා අනුව තෝරා පත් කර ගනු ලබන ඒ රීතිවලින් විධිවිධාන සලස්වා ඇති සාමාජිකයන් සංඛ්‍යාවකගෙන් සමන්විත වූ කළමනාකරණ මණ්ඩලයක් විසින් එකී රීතිවලට යටත් ව පරිපාලනය කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ ප්‍රථම කළමනාකරණ මණ්ඩලය මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී සමිතියේ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකත්වය දැරුවා වූ ද මෙහි උපලේඛනයේ නම් සඳහන් කොට ඇත්තා වූ ද තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

සංස්ථාවේ රීති.

**6**. (1) පහත දැක්වෙන සියලු ම කරුණු හෝ ඉන් කිසිවක් සඳහා මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට අනුකූල නොවන රීති, සංස්ථාවේ යම් මහා සභා රැස්වීමක දී ඊට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු බහුතර ඡන්දයෙන් කලින් කල සංස්ථාව විසින් සෑදීම නීත්‍යානුකූල වන්නේ ය.

(අ) සාමාජිකත්වය වර්ග කිරීම සහ සාමාජිකයන් ඇතුළු කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම හෝ ඔවුන් නෙරපීම;

(ආ) සංස්ථාවේ නිලධරයන් තෝරා පත් කර ගැනීම, ඔවුන්ගේ ඉල්ලා අස්වීම, ඔවුන් ධුරයෙන් අස් කිරීම හෝ ඔවුන් ධුරයෙන් නෙරපීම සහ ඔවුනගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ;

(ඇ) පාලක මණ්ඩලයේ සාමාජිකයන් තෝරා පත් කර ගැනීම සහ පාලක මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය සහ කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ ධුර කාලය ;

(ඇ) සංස්ථාවේ විවිධ නිලධරයන්ගේ, නියෝජිතයන්ගේ සහ සේවකයන්ගේ බලතල, චර්යාව, කාර්ය සහ කර්තව්‍ය ;

(ඉ) පාලක මණ්ඩලයේ රැස්වීම් කැඳවීම, පැවැත්වීම සහ ඒ රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය, ඒ රැස්වීම පවත්වන දිනය, ස්ථානය, රැස්වීම් පිළිබඳ දැන්වීම්, න්‍යාය පත්‍ර හා රැස්වීම්වලට ගණපූරණය හා රැස්වීම්වල දී සාකච්ඡාවට භාජනය කළ යුතු කරුණු ;

(ඊ) සංස්ථාවේ දේපළ පරිපාලනය කිරීම සහ කළමනාකරණය කිරීම, සංස්ථාවේ අරමුදල්වල භාරකාරත්වය සහ සංස්ථාවේ ගිණුම් පවත්වාගෙන යාම හා ඒවා විගණනය කිරීම ;

(උ) සාමාන්‍යයෙන් සංස්ථාවේ කටයුතු කළමනාකරණය කිරීම සහ එහි පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම.

(2) සංස්ථාව විසින් සාදනු ලැබූ යම් රීතියක්, (1) වන උප වගන්තිය යටතේ රීතියක් සාදනු ලැබූ ආකාරයෙන් ම සංශෝධනය කිරීම, වෙනස් කිරීම, ඊට යමක් එකතු කිරීම හෝ එය පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(3) සංස්ථාවේ සියලු ම සාමාජිකයන් සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත් විය යුතු ය.

සංස්ථාවේ අරමුදල.

7. (1) සංස්ථාවට එහිම අරමුදලක් තිබිය යුතු අතර, ත්‍යාග, තෙස්තමේන්තු නීයාදන, පරිත්‍යාග දායක මුදල්, සම්මාදම් මුදල් ගාස්තු හෝ ප්‍රදාන මගින් සංස්ථාවේ ගණනට මෙතෙක් ලැබුණු හෝ මින් මතු ලැබෙන්නා වූ සියලු මුදල් කළමනාකරණ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන බැංකුවක හෝ බැංකු වැඩි ගණනක සංස්ථාවේ බැරට තැන්පත් කරනු ලැබිය යුතු ය.

(2) සංස්ථාවේ දේපළ පුනරුත්ථාපනය කිරීම, සංවර්ධනය කිරීම හෝ වැඩි දියුණු කිරීම සඳහා යම් අගය ක්ෂයවීමේ අරමුදලක්, සංචිතයක් හෝ නිදන් අරමුදලක් සංස්ථාව විසින් පිහිටුවනු ලැබිය හැකි ය.

(3) මේ පනත යටතේ සංස්ථාවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය හා කර්තව්‍ය ඉටුකිරීමේ දී සංස්ථාව විසින් දරනු ලබන යම් වියදමක් ගෙවීම පිණිස වූ සියලු මුදල් සංස්ථාවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

සමිතිය විසින් ගෙවිය යුතු සහ සමිතියට අය විය යුතු ණය.

8. මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පැවති සමිතිය විසින් ගෙවිය යුතුව තිබුණු ණය සහ බැරකම් මෙයින් සංස්ථාපනය කරනු ලැබූ සංස්ථාව විසින් ගෙවිය යුතු අතර, එදිනට සමිතියට අයවිය යුතුව තිබුණු සියලු ණය සහ ලැබිය යුතුව තිබුණු සියලු ණය සහ සම්මාදම් මුදල් සහ දායක මුදල් මේ පනතේ කාර්ය සඳහා සංස්ථාවට ගෙවනු ලැබිය යුතු ය.

සංස්ථාව විසින් චංචල හෝ නිශ්චල දේපළ දැරිය හැකි බව.

9. යම් මිලට ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, තෙස්තමේන්තු නීයාදනයක් ප්‍රකාර හෝ වෙනත් යම් ආකාරයකින් හෝ සංස්ථාව වෙත පවරනු ලැබූ චංචල හෝ නිශ්චල යම් දේපළක් අත් කර ගැනීමට සහ දැරීමට නීතියෙන් සංස්ථාවට හැකියාව සහ බලය ඇති අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදුදීමේ, හුවමාරු කිරීමේ හෝ වෙනත් ආකාරයකින් නීයාදනය කිරීමේ පූර්ණ බලය ඇතිව, මේ පනතේ කාර්ය සඳහා, සංස්ථාවේ තත්කාලයේ වලංගුව බලපවත්නා, රීතිවලට යටත්ව සංස්ථාව විසින් දැරිය යුතු ය.

විසුරුවා හැරීමෙන් පසු ඉතිරිවන දේපළ.

10. සංස්ථාව විසුරුවා හරිනු ලැබූ විට, එහි සියලු ණය සහ බැර කම් ගෙවා සමථයකට පත් කරනු ලැබීමෙන් පසු කවර හෝ යම් දේපළක් ඉතිරිවේ නම්, ඒ දේපළ සංස්ථාවේ සාමාජිකයන් අතර බෙදා දෙනු නොලැබිය යුතු ය. එහෙත් සංස්ථාවේ පරමාර්ථවලට සමාන පරමාර්ථ ඇත්තා වූ ද යම් ආදායමක් හෝ ලාභ කිසිවක් තම සාමාජිකයන් අතර බෙදා දීම රීති මඟින් තහනම් කරනු ලැබ ඇත්තා වූ වෙනත් සංගමයකට හෝ සංගම්වලට ඒ දේපළ දීම හෝ පැවරීම කරනු ලැබිය යුතු ය. එම සංගමය හෝ සංගම් සංස්ථාව විසුරුවා හරින අවස්ථාවේ දී හෝ විසුරුවා හැරීමට පෙරාතුව ම සංස්ථාවේ සාමාජිකයන් විසින් තීරණය කරනු ලැබිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

11. සංස්ථාවේ මුද්‍රාව විධායක ලේකම්වරයා භාරයේ තැබිය යුතු අතර, සභාපතිවරයා සහ ලේකම්වරයා ඉදිරිපිට දී හැර, මුද්‍රාව කවර වූ හෝ යම් සාධන පත්‍රයකට නොතැබිය යුතු අතර, එකී තැනැත්තන් තමන් පැමිණ සිටි බවට ලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයෙහි තම නම් අත්සන් කළ යුතු ය. තව ද එම අත්සන් කිරීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකුගේ අත්සන් කිරීමට පරිබාහිරව විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**12**. මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ සහ ඔවුන්ගේ සහ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම්පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තකුගේ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවන්නේ ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

**13**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය [5(2) වගන්තිය]

කළමනාකරණ මණ්ඩලය

| | | |
|---|---|---|
| සභාපති | : | ඊ. ඒ. එස්. දිසානායක මහතා |
| උප සභාපති | : | එච්. ටී. කුසුමපාල මහතා |
| විධායක ලේකම් | : | ඩබ්ලිව්. ආර්. පෙරේරා මහතා |
| ලේකම් | : | ඩබ්ලිව්. ටී. පෙරේරා මහතා |
| උප ලේකම් | : | එල්. ලියනගම මහතා |
| භාණ්ඩාගාරික | : | ඩබ්ලිව්. පී. පෙරේරා මහතා |
| කළමණාකාර | : | පී. වී. විජයරත්න මහතා |

| | | |
|---|---|---|
| කාරක සභිකයන් | : | කේ. වී. ආරියසේන මහතා |
| | | සුගත් හෙට්ටිගේ මහතා |
| | | ඩබ්ලිව්. ඒ. සිරිපාල මහතා |
| | | ඩබ්ලිව්. ඒ. පියසිරි මහතා |
| | | පී. එම්. සිරිසේන මහතා |

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු.870කි. (විදේශීය) රු. 1,160 කි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝටස් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.